# දහම් පාසල් අවසාන විභාගය

## බෞද්ධ සංස්කෘතිය

## 02 වන පාඩම: පැවිදි ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්

### [[ 2024/2025 ]] 02 වන ප්‍රශ්නය

I සතරාකාර ප්‍රත්‍යවේක්ෂා හඳුන්වා,එය පැවිදි සමාජයට වැදගත්වන ආකාරය විස්තර කරන්න.

II ගිලානෝපස්ථානය බුදුරජාණන් වහන්සේ අගය කළ ආකාරය විස්තර කරන්න.

III ශිෂ්‍යකු විසින් සිය ගුරුවරයාට සැළකිය යුතු ආකාරය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් පැහැදිලි කරන්න.

### [[ 2020/2021/2022/2023 ]] 02 වන ප්‍රශ්නය

I ආදර්ශවත් පැවිදි කුල පුත්‍රයාගේ දෛනික ජීවිතය ගතවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

II සිවුපසය පිළිගැනීමේදී හා එය පරිභෝජනයේදී පැවිද්දා අනුගමනය කළ යුතු පොදු සිරිත් හඳුන්වා දෙන්න.

III දහවල් දානයෙන් පසු පස්වරුවේදී භික්ෂූන්ගෙන් ඉටුවන කාර්යභාරය ගැන ඇගයීමක් කරන්න.

### 03 වන ප්‍රශ්නය

I භික්ෂුවක පරිභෝජනය කරන සිවුරු කට්ටලය හඳුන්වා, එය භාවිතා කළ යුතු අවශ්‍යතා විස්තර කරන්න.

II සිවුරු ඇඳීම හා පෙරවීම ආශ්‍රිතව පවත්නා සේඛියා සික පද පැහැදිලි කරන්න.

III භික්ෂුවගේ සිවුරු පරිභෝජනය සහ ගිහියාගේ ඇඳුම් පැළඳුම් පරිභෝජනය ආශ්‍රිතව පවත්නා අසමානතා විමර්ෂණය කරන්න.

විල්වල ස්කෝලේ හාමුදුරුවෝ

## [[ 2018/2019 ]] 02 වන ප්‍රශ්නය

I ගිහි පැවිදි දෙපක්ෂයටම වැදගත් වන චාරිත්‍රයක් වශයෙන් ගිලනෝපස්ථානය හඳුන්වා දීමට බුදුරදුන් අනුදැන වදාළ හේතු සාධක පෙන්වා දෙන්න.

II ගිලානෝපස්ථානයේදී යෝග්‍ය ගිලනා හා උපස්ථායකයා සතුව තිබිය යුතු ගුණාංග විස්තර කරන්න.

III ගිලානෝපස්ථානයෙ යෙදුණු පැරණි ශ්‍රී ලාංකික බෞද්ධ රජවරුන් ගැන විමර්ෂණයක් කරන්න.

## [[ 2017/2018 ]] 02 වන ප්‍රශ්නය

I දන් වැළඳීමේදී බෞද්ධ භික්ෂුව විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම විස්තර කරන්න.

II –

III ආගන්තුක සත් කාර්‍ය බෞද්ධ පැවිද්දාට මෙන්ම ගිහියාටද වැදගත්වන ආකාරය දක්වා,එහිදි මේ දෙපක්ෂය විසින් අනුගමනය කළ යුතු චාරිත්‍ර විධි විශ්ලේෂණය කරන්න.

## 03 වන ප්‍රශ්නය

I පැවිදි සමාජයේ පවත්නා ආචාර්‍ය-උපාද්‍යාය හා ශිෂ්‍ය සම්බන්ධය බුද්ධ ශාසනයේ පැවත්මට ඉවහල්වන ආකාරය දක්වන්න.

II ගිහි සමාජයේ ගුරුගෝල සම්බන්ධයේ මනා පැවත්මට අදාළ බෞද්ධ ඉගැන්වීම් කවරේදැයි සිඟාලෝවාද සූත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

III පැරණි ගුරුගෝල සම්බන්ධය පිළිබඳව පවත්නා ශ්‍රී ලාංකික සාහිත්‍යගත සාධක දක්වා වර්තමාන පාසල් අධ්‍යාපනයේ දියුණුව උදෙසා මෙයින් ලබාගත හැකි පිටිවහල කෙබඳු දැයි පිරික්සන්න.

## [[ 2015/2016 ]] 01 වන ප්‍රශ්නය

I -

II –

III ‘ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය’හඳුන්වා පැවිදි සමාජයේ පැවත්ම උදෙසා එමඟින් සැළසෙන යහපත පිරික්සන්න.

## 02 වන ප්‍රශ්නය

I "ප්‍රත්‍යවේක්ෂා කිරීම" යනු කුමක්දැයි පැහැදිලි කොට එමඟින් භික්ෂු ජීවිතයෙහි කවර ගුණාංග පිළිබිඹු වේදැයි විමර්ශණය කරන්න.

II භික්ෂූන් වහන්සේලාගේ දන් වැළඳීම ආශ්‍රිත ශික්ෂාපද ඇසුරෙන් හෙළිවන මූලික ආචාර ධර්ම පද්ධතිය පැහැදිලි කරන්න.

III ආහාර ගැනීමේදී බෞද්ධ ගිහියන් විසින් පිළිපැදිය යුතු සිරිත්විරිත් මොනවාදැයි විස්තර කරන්න.

## [[ 2014/2015 ]] 02 වන ප්‍රශ්නය

I බෞද්ධ ශ්‍රාවක පිරිස ගිහි-පැවිදි යනුවෙන් දෙකොටසකට බෙදා දැක්වීමේ හේතු යුක්ති පෙන්වා දෙන්න.

II කුල දරුවකු පැවිදි බිමට ඇතුළත් කිරීමේදී අනුගමනය කෙරෙන චාරිත්‍ර විධි පිළිවෙළින් දක්වන්න.

III සාමණේර පැවිද්දකු විසින් පිළිපැදිය යුතු ශීලය විමර්ෂණය කරන්න.

## 03 වන ප්‍රශ්නය

I උපසම්පදා කර්මයේදී ප්‍රමුකත්වය ගන්නා ආචාර්‍ය,උපජ්ඣාය හා කම්මාචරිය යන තෙරවරුන්ගේ කාර්‍යභාරය පැහැදිලි කරන්න.

II භික්ෂුවගේ තුන් සිවුර හඳුන්වා ඒවා පරිහරණයේදී පිළිපැදිය යුතු සේඛියා ශික්ෂා පද ගැන විස්තරයක් කරන්න.

III " බෞද්ධ ගිහියාට යෝග්‍ය වන්නේ පවිත්‍ර හා සරල ඇඳුම් පරිහරණය පුරුදු වීමයි."විමසන්න.

## [[ 2013/2014 ]] 03 වන ප්‍රශ්නය

I ආදර්ශවත් භික්ෂුවගේ ආරාමික ජීවිතයට අදාළ දෛනික චාරිත්‍ර විධි කෙටියෙන් දක්වන්න.

II දන් වැළඳීමේදී භික්ෂූන් වහන්සේ මෙනෙහි කළ යුතු ප්‍රත්‍යවෙක්ෂාව හඳුන්වා එමඟින් භික්ෂු ජීවිතයෙහි උත්කෘෂ්ට භාවය හෙළිවන ආකාරය දක්වන්න.

III භික්ෂූන් වහන්සේගේ දන් වැළඳීමට අදාළ සිරිත් බෞද්ධ ගිහියන්ට පවා වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

විල්වල ස්කෝල්ලේ හාමුදුරුවෝ

## [[ 2012/2013 ]] 02 වන ප්‍රශ්නය

I සැම ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයකු විසින්ම පැවිදි ජීවිතයට ඇතුළත් වීමට පෙර සම්පූර්ණ කළයුතු අවශ්‍යතා හා සුදුසුකම් මොනවාදැයි හඳුන්වන්න.

II කුල දරුවකු පැවිදි කිරීමේදී අනුගමනය කෙරෙන චාරිත්‍ර විධි පැහැදිලි කරන්න.

III සාමණේර දස සීලය හඳුන්වා එමඟින් සාමණේර ජීවිතයෙහි ස්මතුවී පෙනෙන විශේෂතා විමර්ශනය කරන්න.

## 03 වන ප්‍රශ්නය

I භික්ෂූන් වහන්සේලාගේ සිවුරු කට්ටලයට අයත් තුන් සිවුර නම් කොට සිවුර ඇඳීම හා පෙරවීම ආශ්‍රිතව පවත්නා ශික්ෂා පද හඳුන්වන්න.

II සිවුරු පරිභෝජනයට අදාළ ප්‍රත්‍යවේක්ෂා කිරීම හඳුන්වා මෙමඟින් භික්ෂු ජීවිතයට සැලසෙන යහපත දක්වන්න.

III ගිහියන් විවිධ අවශ්ථාවලට යෝග්‍ය ආකාරයෙන් ඇඳුම් භාවිතා කළ යුතු ආකාරය පිළිබඳ විග්‍රහයක් කරන්න.

## [[ 2011/2012 ]] 02 වන ප්‍රශ්නය

I ස්වකීය ගෘහ පරිසරය සකස් කර ගැනීමේදී පවා පන්සලේ පවත්නා විධිමත් භාවය හා පවිත්‍රතාව ඇසුරෙන් ගෘහස්තයන්ට මනා ආදර්ශයක් ලබාගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

II ගිලානෝපස්ථානය බෞද්ධයන්ගේ උසස් චාරිත්‍ර ධර්මයක් මෙන්ම,අගනා සමාජ සේවයක්ද වන ආකාරය පැහැදිලි කරන්න.

III බෞද්ධ ගිහි-පැවිදි දෙපක්ෂය අතර ආහාර ගැනීමේදී හා දන් වැළඳීමේ සිරිත්වල පවතින වෙනස්කම් පිළිබඳ විමසුමක් කරන්න.

## [[ 2010/2011 ]] 02 වන ප්‍රශ්නය

I සිවුපසය නම් කරන්න.

II බෞද්ධ භික්ෂුවගේ දන් වැළඳීමට අදාළ කරුණු ගෙනහැර දක්වන්න.

III බෞද්ධ භික්ෂූන් වහන්සේගේ සේනාසන පරිභෝජනය පිළිබඳ සිරිත් විරිත් කවරේදැයි සාකච්ඡා කරන්න.

## 03 වන ප්‍රශ්නය

I සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ගුරුවරයා විසින් ශිෂ්‍යයා කෙරෙහි පිළිපැදිය යුතු අංග කී වැදැරුම්ද? ඒවා නම් කරන්න.

II යහපත් ගුරුගෝල සම්බන්ධතාවක් නිර්මාණය කර ගැනීමට සිඟාලෝවද සූත්‍රය උපයෝගී කරගත හැකි අයුරු සාකච්ඡා කරන්න.

III ආගන්තුක භික්ෂුව කෙරෙහි නේවාසික භික්ෂුවක පිළිපැදිය යුතු සිරිත් විරිත් පැහැදිලි කරන්න.

## [[2009/2010 ]] 02 වන ප්‍රශ්නය

I භික්ෂූන් වහන්සේ නමකට අයත් තුන් සිවුරු නම් කරන්න.

II සිවුරු හැදීම පෙරවීම පිළිබඳව බුදු සස්නේ දක්වා ඇති කරුණු කී වැදැරුම්ද? ඒවා පිළිවෙළින් නම් කරන්න.

III ගිහියන්ගේ ඇඳුම් භාවිතය හා බැඳුණු සිරිත් ගැන ඇගයීමක් කරන්න.

## [[ 2008/2009 ]] 02 වන ප්‍රශ්නය

I භික්ෂූන් වහන්සේ දන් වැළඳීමේදී අනුගමනය කළ යුතු වත් පිළිවෙත් නම් කරන්න.

II ආහාර ගැනීමේදී බෞද්ධ ගිහියන් අනුගමනය කළ යුතු සිරිත් කීපයක් හඳුන්වා දෙන්න.

III බෞද්ධ ගිහි-පැවිදි දෙපක්ෂය අතර ආහාර ගැනීමේ හා දන් වැළඳීමේ සිරිත්වල පවතින වෙනස්කම් පිළිබඳව විමසීමක් කරන්න.

## [[ 2007/2008 ]] 02 වන ප්‍රශ්නය

I ආදර්ශමත් භික්ෂුවකගේ දෛනික ජීවිතයේ අනුගමනය කළ යුතු චාරිත්‍ර විධි හඳුන්වා දෙන්න.

II ගිහියන් ඇඳුම් භාවිතා කළ යුතු අන්දම පිළිබඳ සිරිත් හඳුන්වා දෙන්න.

III ගුරු-ශිෂ්‍යය සම්බන්ධය පැවත්වීම පිළිබඳ සිරිත් විරිත් පැහැදිලි කොට එය සමාජ සුභ සිද්ධියට හේතුවන ආකාරය පැහදිලි කරන්න.

## 03 වන ප්‍රශ්නය

I සිඟාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන ශිෂ්‍යයා විසින් ගුරුවරයා කෙරෙහි පැවත්වීමට නිර්දේශිත යුතුකම් නම් කරන්න.

II "ආගන්තුක වත", "ගිහි ආගන්තුක සත්කාර", "ආචාර සමාචාර විධි" යන මාතෘකා තුනෙන් එකක් සාකච්ඡා කරන්න.

## [[ 2006/2007 ]] 01 වන ප්‍රශ්නය

III ශාසනික චිරස්ථිතිය පිණිස ගිහි-පැවිදි සම්බන්ධතාව උපයෝගී වන අයුරු සාකච්ඡා කරන්න.

## 02 වන ප්‍රශ්නය

I පැවිදි බිමට ඇතුළත්වීමට අවශ්‍ය සුදුසුකම් කවරේදැයි දක්වන්න.

II භික්ෂූන් වහන්සේලා විසින් පවත්වනු ලබන දෛනික චාරිත්‍ර විධි මඟින් ශාසනයේ අභිවෘද්ධිය සිදුවන ආකාරය කෙටියෙන් හඳුන්වන්න.

III "මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලාංකිකයන් ආගන්තුක සත්කාරයට නැඹුරු වූයේ බුදු දහමේ අභාෂයෙනි." ගිහි ආගන්තුක සත්කාර ඇසුරින් මෙය සනාථ කරන්න.

## [[[ 2005 ]]] 02 වන ප්‍රශ්නය

I පැවිදි බිමට අවශ්‍ය සුදුසුකම් හා ඒ පිළිබඳ චාරිත්‍ර විධි දක්වන්න.

II ආදර්ශවත් භික්ෂූන් වහන්සේගේ දෛනික ජීවිතයට අදාළ චාරිත්‍ර විධි හෙවත් දිනචරියාව හඳුන්වන්න.

III බෞද්ධාගමික අධ්‍යාපනය ආශ්‍රිතව පැවති ගුරු-ශිෂ්‍යය සම්බන්ධය පැහැදිලි කරන්න.

## [[[ 2003 ]]] 02 වන ප්‍රශ්නය

I භික්ෂුවගේ තුන් සිවුර නම් කරන්න.

II සිවුරු හැඳීම හා පෙරවීම පිළිබඳව බුදුරජාණන් වහන්සේ දැක්වූ අදහස් දෙකක් පැහැදිලි කරන්න.

III පැවිදි පක්ෂයෙන් ආදර්ශ ලබාගන්නා ගිහියා ඇඳුම් භාවිතා කළ යුත්තේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

## [[[ 2002 ]]] 01 වෙනි ප්‍රශ්නය

I බෞද්ධ ආරාමික ජීවිතයට සම්බන්ධ උපාධ්‍යාය, සද්ධි විහාරික, අන්තේවාසික යන පුද්ගලයන් හඳුන්වන්න.
II ශිෂ්‍යයා විසින් ගුරුවරයා කෙරෙහි පැවතිය යුතු ආචාර ධර්ම තුනක් හඳුන්වන්න.
III මනා ගුරු ශිෂ්‍යය සම්බන්ධයක් පැවතීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන විස්තර කරන්න.

## [[[ 2000 ]]] 02 වන ප්‍රශ්නය

I ශිෂ්‍යයා විසින් ගුරුවරයා කෙරෙහි පැවත්විය යුතු යුතුකම් තුනක් ලියන්න.
II එම යුතුකම් අතරින් එකක් ගැන විස්තර කරන්න.
III මනා ගුරු ශිෂ්‍යය සම්බන්ධය ශිෂ්‍යය ජීවිතය සාර්ථකත්වයට පමුණුවා ගැනීමට උපකාරවත් වන අයුරු පැහැදිලි කරන්න.

## [[[ 1999 ]]] 01 වන ප්‍රශ්නය

I “තමන්ට වඩා ළාබාල කෙනෙකු වුවත් සුදුසු අනුශාසනාවක් කළහොත් එය නිහතමානීව පිළිගත යුතුය.” මෙයට නිදසුනක් ලෙස දැක්විය හැකි බුද්ධ ශ්‍රාවකයන් වහන්සේ ගැන කෙටි හැඳින්වීමක් කරන්න.
II මෙයට අදාළ සිද්ධිය සැකෙවින් දක්වන්න.
III බුදු දහමින් ඉගැන්වෙන මෙම ආදර්ශය ඔබගේ ජීවිතයට ප්‍රයෝජනවත් වන අයුරු පැහදිළි කරන්න.

## (1998) 01 වන ප්‍රශ්නය

I පැවිදි ජීවිතයට අවශ්‍ය සිව්පසය නම් වශයෙන් දක්වා ඒවායින් එකක් ගැන කෙටි හැඳින්වීමක් කරන්න.
II ප්‍රත්‍යවේක්ෂා කිරීම යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

III ආචාර්ය ධර්මයන්ට අනුරූප වන පරිදි ගිහියන්ගේ ඇඳුම් පැළඳුම් සකස් විය යුතු දැයි දක්වන්න.

## 02 වන ප්‍රශ්නය

I බෞද්ධයන් අතර පවත්නා වැදගත් ආචාර සමාචාර විධි තුනක් ලියන්න.

II වැඩිහිටියන්ට සැලකිය යුතු ආකාරය ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

III ආචාර සමාචාර විධි පිලිපැදීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන විස්තර කරන්න.

(1996)

## 02 වන ප්‍රශ්නය

I ගිලනුන්ට උපස්ථාන කරන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න.

II බුදුන් වහන්සේ ගිලානෝපස්ථානය අගය කල බවට කරුණු කිහිපයක් දක්වන්න.

III බෞද්ධ රාජ්‍ය පාලකයින් විසින් ආරම්භ කරන ලද සෞඛ්‍ය සේවාවන් විස්තර කරන්න.

## 03 වන ප්‍රශ්නය

I ශිෂ්‍යා විසින් ගුරුවරයා කෙරෙහි පැවැත්විය යුතු යුතුකම් තුනක් ලියන්න.

II ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න.

III ගුරු ශිෂ්‍ය සම්බන්ධයට අදාළ පිය පුතු සංකල්පය විස්තර කරන්න.